(ඇ) පරීක්ෂණ නිලධාරියාට ළඟාවිය හැකි පරිදි ගරාජය පිහිටා ඇති ස්ථානය නිශ්චිතව පෙන්නුම් කරන හා ආසන්නම නගර මධ්‍යයේ සිට එම ස්ථානයට ළඟා විය හැකි මාර්ගය දැක්වෙන දළ සිතියමක් (මාර්ග විස්තරය කෙටියෙන්)

(ඈ) සහතික කිරීමේ නිලධාරි ලෙස ඉදිරිපත් කරනු ලබන අයගේ බර වාහන පැදවීම සඳහා වන වලංගු රියැදුරු බලපත්‍රයේ ඡායා පිටපතක්

(ඉ) ව්‍යාපාර නාම ලියාපදිංචිය හා පිරිවැටුම් බදු ගෙවීම පිළිබඳ සහතිකවල ඡායා පිටපත්

3. වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ eRL 2.0 වැඩසටහන යටතේ වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ දී යෙදවුම් මෘදුකාංගය හරහා පවත්වනු ලබන පරීක්ෂණවල විස්තර සහ ඡායාරූප උඩුගත කිරීම සඳහා ස්මාර්ට් දුරකථනයක් අවශ්‍ය වනු ඇත. එහෙයින් 2027 වර්ෂයේ දී යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජ ලියාපදිංචි කිරීමේ දී ස්මාර්ට් දුරකථනයක් තිබීම අනිවාර්ය අංගයක් සේ සලකනු ලැබේ.

4. අදාළ අයදුම්පත් සතියේ වැඩ කරන දිනවල මෙම කාර්යාලයෙන් ලබාගත හැක. (ඔබ විසින් සකස් කරගෙන ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

5. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවර "**යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජ ලියාපදිංචි කිරීම 2027**" යනුවෙන් සඳහන් කර, ප්‍රවාහන කොමසාරිස්, ප්‍රවාහන දෙපාර්තමේන්තුව, අංක 104, යටිනුවර වීදිය, මහනුවර යන ලිපිනයට **2026 ඔක්තෝබර් මස 07 දින හෝ ඊට පෙර** ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් පිළිබඳව සළකා බලනු නොලැබේ.

අයි. එස්. රත්නායක,
ප්‍රවාහන කොමසාරිස්,
ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
මධ්‍යම පළාත.

2026 අගෝස්තු මස 31 දින,
මධ්‍යම පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 104,
යටිනුවර වීදිය, මහනුවර.

09-86

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

1.0 බස්නාහිර පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026 ඔක්තෝබර් මස 09** දින වේ. මෙම විභාගය **දෙසැම්බර්** මස පැවැත්වේ.

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳදරා ගත යුතු ය.

**සටහන - මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026 සැප්තැම්බර් මස 14 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 ඔක්තෝබර් මස 09 වැනි දින ප.ව. 9.00ට අවසන් වේ.**

2.0 මෙම තරග විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන්නේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN 1-2025 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සඳහා පමණි. මෙම විභාගය පැවැත්වීමට අපේක්ෂිත නගර සහ නගරවලට අදාළ නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතු මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයන්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |

3.0 (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

4.0 වැටුප :-

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, බස්නාහිර පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය රු.48,470/-10x540 - 11x630 - 10x1,010 - 10x1,190 – රු.82,800/- (MN 2-2025) වේ. පත්වීමක් සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවකුට එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

*සටහන* :- පත්වීම ලබන අවධියේ ක්‍රියාවේ යොදන වැටුප් වැඩිවීමේ නීති රීතිවලට යටත්ව, වැටුප් වැඩිවීම් වාසි ලබාදෙනු ලැබේ.

5.0 **සේවා කොන්දේසි:-**

(i) සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව 82 කි.

(ii) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත් කිරීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත් කිරීම් බලධරයාට බලය ඇත.

(iii) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1898/5 සහ 2015.01.19 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද බස්නාහිර පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2364/32 සහ 2023.12.29 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

(iv) මෙම විභාගයෙන් සාමර්ථ්‍ය ලබන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බස්නාහිර පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(v) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත්, බස්නාහිර පළාත් සභාවේ ඕනෑම තැනකට පත් කිරීමටත් යටත් වේ.

(vi) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු ස්ථාන මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම් පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(vii) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

6.0 **යෝග්‍යතාව :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN 1-2025 වැටුප් කේත යටතේ වැටුප් ලබන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ට පමණක් මෙම තරග විභාගයට අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අපේක්ෂක අපේක්ෂිකාවක්ම ඉහත සඳහන් සුදුසුකමට අමතරව -

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ පාලන චක්‍රලේඛ අංක 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී **දෙවරකට නොවැඩි වාර ගණනකදී** යටත් පිරිසෙයින් සම්මාන සාමර්ථ්‍ය දෙකක් (02) සහිතව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/ වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතු ය.

(iii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iv) සෑම අපේක්ෂකයකුම බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2026 ඔක්තෝබර් 09 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන :-**

1. යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත 6.0(i) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත 6.0(i) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

2. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟ විය යුතු ය.

3. අර්ධ කාර්මික කාර්යයන්හි නියුක්තව සිටින්නා වූ හෝ යම් කාර්යයක් සඳහා පුහුණු කර ඇත්තාවූ හෝ බස්නාහිර පළාත් සභාව විසින් විශේෂ පුහුණුවක් ලබා දී ඇත්තා වූ කවර හෝ ශ්‍රේණියක සේවකයන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත. යම් සේවකයකු සුදුසු ද නුසුදුසු ද යන කරුණු පිළිබඳව යම් සැකයක් පහළ වූ විටදී ඒ සම්බන්ධයෙන් අයදුම්කරු/අයදුම්කාරිය, දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙතින් ඒ සම්බන්ධව විමසිය යුතු ය.

එසේම මෙම කරුණට අදාළව යම් සේවකයකුගේ යෝග්‍යතාව සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙතින් සිදුකරන විමසීමකදී වැටුප් පරිමාණය සහිතව සේවකයාගේ කාර්යයන් පිළිබඳව සම්පූර්ණ විස්තරයක් අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම කාර්යය දැරීම සඳහා අවශ්‍යතා සපුරා ගැනීමට පුහුණුවක් අයදුම්කරුට/අයදුම්කාරියට ලබා දී ඇත් ද යන වග හා එවැනි පුහුණුවක් වෙතොත් එම පුහුණුවේ ස්වභාවය හා කාල සීමාව ද සඳහන් කළ යුතු ය.

**4. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් සේවකයන්, මණ්ඩල, සංස්ථා හා එවැනි අංශවල සේවකයන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත.**

**5. මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සෑහීමට පත්විය යුතු ය. මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන්/අයදුම්කාරියන් විභාගයේදී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුව ද පත්වීම ලැබීමට නුසුදුස්සෝ වෙති.**

7.0 **විභාග කොන්දේසි:**

(i) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතු ය.

(ii) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) විභාග ගාස්තුව රු. 600කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

- (i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
- (ii) ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card)
- (iii) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/Flex යෙදවුම මඟින් (Bank of Ceylon Online Banking Method/Flex App)
- (iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Bank of Ceylon Teller Slip Payment)

**සටහන:** ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ **උපදෙස්** වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(iv) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(v) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

(vi) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය.

**සටහන :** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වෙන දින විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(vii) මෙම විභාගය සඳහා **විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්** ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර, අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ **විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

(viii) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එම විස්තර සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.0 පත්කිරීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ලැබේ.

9.0 *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* :- විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-** අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**12.0 විභාග පටිපාටිය සහ පත්වීම සඳහා තෝරාගනු ලබන ආකාරය :-**

විභාග විෂයය හා ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ. :-

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරි සේවා යෝග්‍යතා පරීක්ෂණය | 100 | 40 | පැය 02 1/2 |
| අභියෝග්‍යතාවය | 100 | 40 | පැය 01 |

සෑම ලිඛිත පිළිතුරු පතක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක. පත්වීමක් සඳහා තෝරා ගැනීමට අයදුම්කරුවකු විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%ක්) ලබාගත යුතු වේ.

මෙම තරග විභාගයට අදාළව පුරප්පාඩු ගණනය කරන දිනට සේවයේ පුරප්පාඩු සංඛ්‍යාවෙන් සේවා ව්‍යවස්ථානුකූලව 30%ක පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් ලිඛිත විභාගයෙන් අත්කරගනු ලබන ලකුණු පදනම් කරගත් කුසලතා අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. උක්ත ඡේදයේ සඳහන් සීමිත තරග විභාගයේ **අවම සමත් ලකුණු ප්‍රමාණය අත්කරගත් පමණින් කිසිදු අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට හෝ පත්වීමක් ලැබීම සඳහා සුදුසුකම් නොලබන බව අවධාරණය කරනු ලැබේ.**

**13.0 විෂය නිර්දේශය : -**

<u>භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරි සේවා යෝග්‍යතා පරීක්ෂණය: (කාලය පැය 2 1/2 යි)</u>

අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යකින් ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් ද,

කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මූලික නීති රීති සහ කළමනාකරණ සේවා නිලධරයකු විසින් කටයුතු කළයුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියා කරන ආකාරය ආදී කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරින්ගේ රාජකාරී පිළිබඳව අපේක්ෂක/අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින් ද,

කාර්යාලයක ප්‍රයෝජනයට ගන්නා ඇමතුම් දින පොත, වවුචර්, වලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී උපකරණ ගැනත්, ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

I වන කොටස - භාෂා හැකියාව මැනෙන ආකාරයේ අවබෝධය හා සම්බන්ධ ව්‍යුහගත ප්‍රශ්න, සාරාංශ කොට ලිවීම සහ රචනය (පැය 1 විනාඩි 15යි ලකුණු 50)

II වන කොටස - කළමනාකරණ සේවා නිලධාරි සේවයට යෝග්‍යතාව මැනෙන සිද්ධියක්, ප්‍රකාශයක් හෝ ඡේදයක් ඇසුරෙන් ගොඩනැගෙන කෙටි ප්‍රශ්න, ව්‍යුහගත ප්‍රශ්න සහ රචනා වර්ගයේ ප්‍රශ්න (පැය 1 විනාඩි 15යි ලකුණු 50)

අභියෝග්‍යතාව (කාලය පැය 01)

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

බහුවරණ ප්‍රශ්න සහ කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50යි (කාලය පැය 01) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

14.0 මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

15.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

**තිලක් සෙනරත්**
ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2026 සැප්තැම්බර් මස 11 වැනි දින,
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 628, 10 වන මහල,
ජනජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර,
රාජගිරිය.

09-140

"කාර්යක්ෂමතාවයෙන් යුත් ඵලදායී පළාත් සභා රාජ්‍ය සේවයක්"

**ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ஊவா மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு

Uva Provincial Council Public Service Commission

අංක 14 4, පීලිපොතගම පාර,පිණරාව,බදුල්ල. இல 14 4,பீலிபொத்தகம வீதி,பிங்கராவ,பதுளை. No 14 4,Peelipothagama Road, Pinarawa,Badulla.

මගේ අංකය / எனது இல / My No. 3/3/1/138

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2026.09. 11

ඌව පළාතේ ප්‍රධාන ලේකම්,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
ඌව පළාත් සභාවේ සභා ලේකම්,
ඌව පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
ඌව පළාත් සමුපකාර කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන්,
වෛද්‍ය අධිකාරි, මූලික රෝහල - දියතලාව/මහියංගණය/වැලිමඩ,
නාගරික කොමසාරිස් - බදුල්ල/බණ්ඩාරවෙල,
නාගරික ලේකම්,හපුතලේ,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියලුම ප්‍රාදේශීය සභා ලේකම්වරු,

**<u>ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026</u>**

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවීමට අදාල අභ්‍යන්තර නිවේදනය www.old.psc.up.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.

02. එකී නිවේදනය මගින් ලබාදී ඇති අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2026.09.25** දින වන අතර, ඒ අනුව **2026.09.25** දින දක්වා අදාල සුදුසුකම් සපුරා ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

03. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2026.08.28 දිනැති හා අංක 2504 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පළකරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනයට සමගාමීව මෙම අයදුම්පත් කැඳවීම සිදුකරනු ලැබේ. ඒ අනුව මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් වෙනුවෙන් බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය මෙම වර්ෂයේ දෙසැම්බර් මස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පැවැත්වීමට අපේක්ෂිත අතර, මෙම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය කිසිදු හේතුවක් මත නැවත දීර්ඝ කරනු නොලැබේ.

04. මේ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ /දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ සේවය කරන PL 1/PL 2/PL 3 /MN 1 වැටුප් බාණ්ඩවල සේවය කරන සේවකයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මේ සඳහා අයදුම්කිරීමට කැමති හා අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාරව සුදුසුකම් සපුරන අය වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ <u>www.doenets.lk</u> වෙබ් අඩවිය යටතේ ඇති Online Applications – Recruitment /E.B Exams වෙත පිවිස, මාර්ගගත ක්‍රමයට (Online) අයදුම්පත් යොමු කළ යුතු බව වැඩි දුරටත් දන්වා සිටිමි.

(එල්.ඒ.සෝමරත්න)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සභාපති / தௌ தவிசாளர் / Hon. Chairman 055 - 2222150
ලේකම් / செயலாளர் / Secretary 055 - 2223482
පොදු / பொது / General 055 - 2222400
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst Secretary 055 - 2225148, 055 - 2232857 (Exam)
පරිපාලන නිලධාරි / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer 055 - 2222400
Fax - 055-2232858
Website - www.psc.up.gov.lk

# ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - (2026)

01. ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2026 දෙසැම්බර් මස දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ යටතේ ඇති Online Applications – Recruitment /E.B Exams ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026.09.14 වැනි දින පෙ.ව 9.00 ට විවෘත වන අතර 2026.09.25 වැනි දින ප.ව 9.00 ට අවසන් වේ.

(ආ) අයදුම්කරුවන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

02. මෙම විභාගය පහත සඳහන් නගරවලදී පැවැත්වේ. එම නගර සහ නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයන් වෙනත් විභාග මධ්‍යස්ථානයකට යොමු කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |

03. **බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

(i) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN 01 - 2025 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2026 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමර්ථ්‍ය දෙකක් සහිතව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ්‍ය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(iv) සෑම අපේක්ෂකයකුම ඌව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මනා ශාරීරික, මානසික යෝග්‍යතාවකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(v) සෑම අයදුම්කරුවකුම මෙම තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියලුම සුදුසුකම් 2026.09.25 දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

සටහන :-

1. යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන්ම පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත සඳහන් (ii) හි සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත සඳහන් (ii) හි සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

2. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබීමට නම් ඔහු/ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතුය.

3. අර්ධ කාර්මික කාර්යයන්හි නියුක්තව සිටින්නා වූ හෝ යම් කාර්යයන් සඳහා පුහුණු කර ඇත්තා වූ හෝ රජය විසින් විශේෂ පුහුණුවක් ලබා දී ඇත්තාවූ කවර හෝ ශ්‍රේණියක සේවකයන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු

ඇත. නිදර්ශන වශයෙන් ඉංජිනේරු හා කර්මාන්තශාලා ශ්‍රේණිවල සේවකයන් හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය සේවිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු නොවනු ඇත.

4. යම් සේවකයකු සුදුසු ද නුසුදුසු ද යන කරුණු පිළිබඳව යම් සැකයක් පහළ වූ විටදී ඒ සම්බන්ධයෙන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසිය යුතුය. මේ සම්බන්ධයෙන් විමසීමේදී සේවකයාගේ වැටුප් පරිමාණය සහිතව කාර්යයන් පිළිබඳව පූර්ව විස්තරයක් හා එම කාර්යය දැරීම සඳහා අවශ්‍යතා සපුරා ගැනීමට පුහුණුවක් අයදුම්කරුට/අයදුම්කාරියට ලබා දී ඇත් ද යන වග හා එවැනි පුහුණුවක් වෙතොත් එම පුහුණුවේ ස්වභාවය හා කාලසීමාව ද සඳහන් කළ යුතුය.

5. ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් සේවකයන්, අධිකාරි, මණ්ඩල හා එවැනි අංශවල සේවකයන් හට මෙම විභාගයට ඉදිරිපත් විය නොහැක.

6. මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන් / අයදුම්කාරියන් සෑහීමකට පත්විය යුතුය. මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන් / අයදුම්කාරියන් විභාගයේදී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුව ද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

**04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-**

(අ) අමප/26/0380/802/002-I හා 2026.03.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අනුමත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 30% ක ප්‍රමාණයක් මෙම සීමිත තරග විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ආ) ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.06.30 දින අනුමත කර ඇති ඌව පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, ඌව පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහය හා ඌව පළාත් මුදල් රීති සංග්‍රහයට යටත්ව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(ඇ) තෝරා ගනු ලබන අපේක්ෂකයන් ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ. මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

(ඈ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ඉ) රාජ්‍ය භාෂාවන් නොවන භාෂාවකින් සේවයට පත් වූ නිලධාරියකු සේවයෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතුය. පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව ලබා ගත යුතුය.

**05. වැටුප් පරිමාණය :-** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ප්‍රකාරව,
MN 2 - 2025 - රු. 48,470 - 540 x 11 – 630 x 11 – 1010 x 10 – 1190 x 10 – 82,800/-
ක මාසික වැටුප් පරිමාණය හිමි වේ.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :-**

(අ) සීමිත තරග විභාගයෙන් ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාව මත පවත්වනු ලබන සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

(ආ) සීමිත තරග විභාගය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ. තරග විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඇ) තරග විභාගයේ විෂය නිර්දේශය පහතින් දක්වා ඇත. විභාගයෙන් සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබාගත යුතු අවම ලකුණු සංඛ්‍යාව 40% කි. විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50% ) ලබාගත යුතුය.

07. අයදුම් කළ යුතු පිළිවෙළ :-

(අ) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E.mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරන ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

08. විභාග හා පරිපාලන වියදම් :-

විභාග ගාස්තු රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card With the facility of Internet Transactions)
III. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/Flex යෙදවුම මඟින් (Online Banking Method / of Bank of Ceylon Flex app)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

සටහන

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

09. විභාග පටිපාටිය හා තරග විභාගයේ විෂය නිර්දේශය :-

(ආ) විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. භාෂා හැකියාව සහ කළමනාකරණ සේවා නිලධාරි සේවා යෝග්‍යතා පරීක්ෂණය | පැය 2 ½ | 100 | 40 |
| 2. අභියෝග්‍යතාව | පැය 1 | 100 | 40 |

1. භාෂා හැකියාව සහ කළමනාකරණ සේවා නිලධාරි සේවා යෝග්‍යතා පරීක්ෂණය
(කාලය පැය 2 ½ )

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යකින් ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් ද, කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියා කෙරෙන ආකාරය පිළිබඳ මූලික නීති රීති හා කළමනාකරණ සේවා නිලධරයකු විසින් කටයුතු කළ යුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියාකරන

ආකාරය ආදී කළමනාකරණ සේවා නිලධරයකුගේ රාජකාරි පිළිබඳව අපේක්ෂක / අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින් ද, කාර්යාලයක ප්‍රයෝජනයට ගනු ලබන ඇමතුම් දින පොත, වවුචර්, වලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී උපකරණ ගැනත් ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

**2. අභියෝග්‍යතාව ( කාලය පැය 01)**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂක / අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

බහුවරණ ප්‍රශ්න සහ කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

<u>සටහන :</u>

සෑම ලිඛිත පිළිතුරු පත්‍රයකම නොපැහැදිලි අත් අකුරු සහ වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

## 10. විභාග ප්‍රවේශ පත්‍ර

ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ජායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ජායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(අ) විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය.

(ආ) විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

(ඇ) විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය.

(ඈ) විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**11. අනන්‍යතාවය**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාවය සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ.

තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

12. **සාවද්‍ය තොරතුරු සැපයීම:-**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට පිළිවන.

විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

13. **විභාග ප්‍රතිඵල**

පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

14. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම /නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධි විධාන සලසා නොමැති කිසියම් කරුණක් වේතොත් ඒ ගැන පැහැදිලි කිරීම් / තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදුකරනු ඇත.

15. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

(එල්.ඒ. සෝමරත්න)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2026.09.08 වන දින
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 14/4, පිළිපොතගම පාර,
බදුල්ල.